# විධායක සාරාංශය

ශ්‍රී ලංකාවේ සංහිඳියාව පිළිබඳ පොදු විවාදයන් දැනුවත් කිරීම සඳහා සාක්ෂි උත්පාදනය සහ ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරකම් ඇතුළත් ශ්‍රී ලංකා ගවේෂණයේ කාර්යය (Sri Lanka Barometer) අගය කිරීම සඳහා මෙම අධ්‍යයනය සැලසුම් කර පවත්වන ලදී. මෙම ශ්‍රී ලංකා ගවේෂණය මෙහෙයවනු ලබන්නේ Strengthening Reconciliation Process (SRP), දකුණු අප්‍රිකාවේ Institute of Justice and Reconciliation (IJR) සහ ශ්‍රී ලංකාවේ දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) යන ආයතනවලින් සමන්විත සමූහයක් මගිනි. සංහිඳියාව සහ ඒ සඳහා වන ප්‍රගතිය පිළිබඳ අවබෝධය සහ අපේක්ෂාවන් ගැඹුරු කිරීම පිළිබඳ පර්යේෂණවලට සහාය වීම සඳහා ශ්‍රී ලංකාවේ බහු පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගැනීමට මෙම සමූහය අරමුණු කරයි. ***පශ්චාත් යුධ ශ්‍රී ලංකාවේ තරුණ අනන්‍යතාවය සහ කතිකාවන්*** යන මාතෘකාවෙන් යුත් මෙම පර්යේෂණ පත්‍රිකාව අනන්‍යතාවය, කලාව, සමාජ මාධ්‍ය, ගැටුම් සහ සංහිඳියාව අතර පවතින සම්බන්ධතාවය අධ්‍යයනය කිරීමේ උත්සාහයකි. මෙම අධ්‍යයනය තරුණයින් අතර අනන්‍යතාවය නිර්මාණය කිරීමේ ක්‍රියාවලීන් ගවේෂණය කරන අතර, ජාතිකවාදය පිළිබඳ කතිකාවන් සහ එම කතිකාව තුළ පවතින ප්‍රමුඛ බහුතර ආඛ්‍යාන සහ ඒවා සමඟ පවතින විකල්ප සහ සුළුතර ආඛ්‍යාන හා සම්බන්ධ තරුණ ක්‍රියාකාරකම් පිළිබඳව ද ගවේෂණය කරයි. එවැනි ක්‍රියාවලීන් ගවේෂණය කිරීමේදී, මෙම අධ්‍යයනය 2019 අග සහ 2020 මුල් කාලය අතරතුර භෞතික අවකාශයන් සහ එම ස්ථානවලින් ඉක්මවා ගොස් අන්තර්ජාල අවකාශයන්හි දී පැවති බිතුසිතුවම් රැල්ල වෙත අවධානය යොමු කළේය.

මෙම පර්යේෂණ පත්‍රිකාව දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය ලෙස Critical Discourse Analysis භාවිතා කර ඇත. විශ්ලේෂණය කරන ලද දත්ත ඔවුන්ගේ න්‍යාය පත්‍ර සැකසීමේ ක්‍රියාකාරීත්වය සහ බෙනඩික්ට් ඇන්ඩර්සන් (Benedict Anderson) විසින් තේරුම් ගත් පරිදි අනන්‍යතා නිර්මාණය සම්බන්ධයෙන් සොයා බලන ලදී. මෙම අධ්‍යයනය සිදු කිරීම සඳහා, සමාජ මාධ්‍යවල පළ වූ බිතුසිතුවම් රැල්ලට අදාළ පළ කිරීම් පිළිබඳ පර්යේෂණක් සමඟ, ප්‍රධාන පුද්ගල සම්මුඛ සාකච්ඡා (Key Person Interviews) 10 ක්, ගැඹුරු සම්මුඛ සාකච්ඡා (In-Depth Interviews) 4 ක් සහ විශේෂඥ සම්මුඛ සාකච්ඡා (Expert Interviews) 9 ක් ද සිදු කරන ලදී.

අධ්‍යයනයේ සොයාගැනීම්වලින් හෙළි වූයේ බිතුසිතුවම් රැල්ල තුළ අනෙකුත් ආඛ්‍යාන අතර ආධිපත්‍යය දැරූ පැහැදිලි ආඛ්‍යානයක් ඇති බවයි. මෙම ප්‍රමුඛ ආඛ්‍යානය ජනවාර්ගිකවාදය, යුධ-ජයග්‍රාහීත්වය සහ මිලිටරිකරණය මගින් සංලක්ෂිත විය. බිතු සිතුවම්වල ඇති තේමාවන්, සංකේත, එමෙන්ම ප්‍රතිචාර දැක්වූවන්ගේ සාකච්ඡා පිළිවෙත් (discursive practices) මගින් මෙම කතිකාවන් සිංහල බෞද්ධ හැඟීම් සමඟ සම්බන්ධ වී ඇති බව පෙන්නුම් කරයි. බිතුසිතුවම් රැල්ල තුළ ඇති සුළුතර සහ විකල්ප ආඛ්‍යානවලට සාමය, සහජීවනය, සංහිඳියාව, ජනප්‍රිය සංස්කෘතිය, පරිසරවාදය සහ රාවණා/රාවණන් පිළිබඳ යොමු කිරීම් ඇතුළත් වේ; මෙයින් අවසාන මාතෘකා තුන ගවේෂණය කිරීමට මෙම අධ්‍යයනය තුළ ඉඩක් නොතිබුණි. එම කතිකාව විශ්ලේෂණය කිරීමේදී බිතු සිතුවම්වල අන්තර්ගතය ස්ථානයෙන් ස්ථානයට සහ එම ස්ථානයේ වෙසෙන ප්‍රජාවෙන් වෙනස් වූ බව තවදුරටත් අනාවරණය විය. සිංහල බහුතර ප්‍රදේශවල ඇඳ ඇති බිතු සිතුවම්වල මුලින් සඳහන් කළ ප්‍රමුඛ ආඛ්‍යානය අන්තර්ගත වන අතර දෙමළ බහුතර ප්‍රදේශවල ඇඳ ඇති බිතු සිතුවම් තුළ දේශීය සංස්කෘතිය හා සහජීවනයේ වැදගත්කම සම්බන්ධ රූප සටහන් ඇතුළත් විය.

තරුණ කණ්ඩායම් සහ කලාකරුවන් සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡා බිතුසිතුවම් රැල්ලේ උත්පත්ති ලක්ෂ්‍යවල

බහුත්වය ඉස්මතු කරයි. 2019 ජනාධිපතිවරණයෙන් පසු ජනාධිපති රාජපක්ෂ බිතුසිතුවම් රැල්ල අනුමත කළ බව සමාජ මාධ්‍ය ඔස්සේ අනාවරණය වුවත්, බිතුසිතුවම් රැල්ලේ මූලාරම්භය කිසිදු දේශපාලන අරමුණකින් තොර වූවක් බවත්, එය සම්පූර්ණයෙන්ම අනවශ්‍ය පෝස්ටර් සහ බිල්පත්වලින් පිරුණු නගර අලංකාර කිරීම අරමුණු කරගත් එකක් බවත් කලාකරුවන් අනාවරණය කළහ. 2019ට පෙර පාලන සමයේදී අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සම්බන්ධයෙන් පීඩාවට පත් වූ දේශප්‍රේමී තරුණ තරුණියන්ට දේශපාලනීකරණය වූ මෙම ව්‍යාපාරය රාජ්‍ය අනුග්‍රහය ලබා දුන්නේය. එවැනි රාජ්‍ය අනුග්‍රහයක් ඇතිව, මෙම දේශප්‍රේමී තරුණයින් පොදු අවකාශයන් සහ ස්ථාන සිංහල බෞද්ධ, යුධ-ජයග්‍රාහී සිතුවම් වලින් සරසා, රජය විසින් සකස් කරන ලද න්‍යාය, පොදු අවකාශයන් "අලංකාර කිරීම" හරහා සිංහල බෞද්ධ, ජයග්‍රාහී ආඛ්‍යානය තහවුරු කරන න්‍යායක් බවට පත් කරන ලදී. රජයේ න්‍යාය සුළුතර ආඛ්‍යාන යටපත් කිරීම ද සිදු කළේය; සම්මුඛ සාකච්චාවට ලක් වූවන්ගෙන් හෙළිදරව් වුයේ දෙමළ තරුණයින්ට අවශ්‍ය දේ බිත්ති මත පින්තාරු කිරීම බලධාරීන් විසින් ප්‍රතික්ෂේප කර ඇති බවත් සිතුවම් වල අන්තර්ගතය බලධාරීන් විසින් වාරණය කර තෝරා ගන්නා ලදත් බවය. බිතුසිතුවම් රැල්ල තරුණයන් සමාජයීය පුමිතිරිභාවය වටහාගෙන ක්‍රියා කරන ආකාරය ද ඉස්මතු කරයි. සමාජ මාධ්‍ය ගවේෂණය සහ සම්මුඛ සාකච්ඡාවට සහභාගී වූ සහභාගිවන්නන්ගේ සාකච්ඡා පිළිවෙත් (discursive practices) මගින් හෙළිදරව් වන්නේ මහජනතාව මිලිටරීකෘත පුරුෂභාවය ක්‍රියාකාරකම් සැමරූ බවත්, බිත්ති මත සොල්දාදුවන් නිරූපණය කිරීම හරහා පොදු අවකාශයන් තවදුරටත් මිලිටරීකරනය කිරීමට ඉඩ සලසන බවයි.

සමාජ මාධ්‍ය තුළද බිතුසිතුවම් රැල්ල පිළිබඳ කතිකාවත් තිබුණි. වසංගතය නිසා බිතුසිතුවම් රැල්ලේ පැවැත්ම සමාජ මාධ්‍ය වෙත මාරු විය. අධ්‍යයනය කරන ලද දත්තවලින් හෙළි වන්නේ සජීවීව සිදු වූ බිතුසිතුවම් රැල්ලේ තිබුණු සමෝධානික නියෝජනය සමාජ මාධ්‍යවල නොතිබූ බවයි. සමාජ මාධ්‍යවල බෙදා හරින ලද බිතුසිතුවම් බහුතරයක් සහ ඒවා පිළිබඳ කතිකාවන් හෙළිකළේ සජීවී බිතුසිතුවම් රැල්ල තුළ තිබුණු සිංහල බෞද්ධ, වාර්ගිකවාදී සහ යුධ-ජයග්‍රාහී කතිකාවන් අඩංගු වූ ප්‍රමුඛ ආඛ්‍යාන සමාජ මාධ්‍ය තුළ බහුලව සංසරණය වූ බවයි. රජය විසින් සමාජ මාධ්‍ය ක්‍රමක්‍රමයෙන් උපකරණීකරණය (instrumentalise) කිරීම සහ විකල්ප සහ සුළුතර ආඛ්‍යාන යටපත් කිරීමේ උත්සාහය සමාජ මාධ්‍යවල බිතුසිතුවම් රැල්ලේ මෙම විකෘති නිරූපණයට හේතු විය හැකිය. කතිකාව සමාජ මාධ්‍ය තුළ හැඩගැසුණු ආකාරය විශ්ලේෂණය කිරීමෙන් තවදුරටත් හෙළි වන්නේ සමාජ මාධ්‍ය භාවිතා කරන්නන් නිරන්තරයෙන් තම මතවාද පමණක් ප්‍රතිරාවය කළ හැකි සීමාවක් ඇතුලත ගමන් කරන බවයි. තව දුරටත්, විවිධ මතවාදයන් සමඟ සම්බන්ධ වීමට ඇති අවකාශය අඩු කරන බවත් රට තුළ සංහිඳියාව සහ සහජීවනය සඳහා ඇති අවකාශය ද අවම කරන බව ද එය හෙළි කරයි.

රජයේ න්‍යායන් සැකසීමේදී සහ ඒවා වෙනස් කිරීමේදී අධ්‍යාපනයේ කාර්යභාරය පිළිබඳව විස්තර කෙරෙන තවත් දත්ත කට්ටලයක් විශ්ලේෂණය කිරීමට ද මෙම සම්මුඛ සාකච්ඡා ඉඩ සැලැස්විය. අධ්‍යාපනය යනු අධ්‍යයනයේ අපේක්ෂිත පූර්ව සැලසුම් සහගත ප්‍රතිඵලයක් නොවූවත්, අධ්‍යාපනය සහ අනන්‍යතා නිර්මානය කිරීමේදී එහි භූමිකාව පිළිබඳව සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ පුද්ගලයින්ගේ නිරන්තර යොමු කිරීම් මෙම අධ්‍යයනයට හේතු විය. සහභාගිවන්නන්ට අනුව, අධ්‍යාපන ක්‍රමය කුඩා කාලයේ සිටම දරුවන් අතර ජාති හා ආගම් වශයෙන් බෙදීම් ඇති කරයි. රජය විසින් මධ්‍යගත අධ්‍යාපන සම්පත් නිෂ්පාදනය කිරීම ජනවාර්ගික ගැටුමේ මූල හේතූන්, වාර්ගික ප්‍රචණ්ඩත්වය, සමාජයීය පුමිතිරිභාවය සහ ලිංගික අනන්‍යතා සහ ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබඳව ඒකීය ආඛ්‍යානයක් සහිත ඉතිහාසයක් අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇත. සහභාගිවන්නන් විසින් පැහැදිලි කරන ලද පරිදි, රජය විසින් සකස් කරන ලද මෙම න්‍යාය ආපසු වෙනස් කිරීමට අධ්‍යාපනයට බලය ඇත. ඒ සඳහා අවශ්‍ය වන්නේ රජය විසින් තහවුරු කරන ලද, වැරදි ලෙස අර්ථකථනය කරන ලද මතකයන් සහ ආඛ්‍යාන බිඳ දැමීම සඳහා අධ්‍යාපන ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම, ඉතිහාස නැවත කියවීමක්, සහ විකල්ප

ඉතිහාස සහ ආඛ්‍යාන ඉගැන්වීමක් බවට පමණි.

අවසාන වශයෙන්, 2019-2020 බිතුසිතුවම් රැල්ල ජනවාර්ගිකවාදය සහ සුළුතර ප්‍රජාවන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස යටපත් කිරීම මත ගොඩනැගුණු පශ්චාත් යුධ ආඛ්‍යානය තවදුරටත් ඉදිරියට ගෙන යාම සඳහා රජයේ න්‍යාය සැකසීමේ කාර්යය ඉටු කළ බව මෙම අධ්‍යයනය හරහා තීරණය කිරීමට හැකි විය. එක් ප්‍රජාවකට සහ ආඛ්‍යානයකට තවත් ප්‍රජාවකට වඩා අනුග්‍රහය දැක්වීම මෙම බිතුසිතුවම් රැල්ල තුළ සමාජ ඒකාබද්ධතාවය, සංහිඳියාව, සාමය, වගවීම සහ සහජීවනය සඳහා ඇති වැදගත්කම සහ අවශ්‍යතාවය ප්‍රවර්ධනය කිරීමට රජයට ඇති ඉඩකඩ අඩු කර ඇත.